ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

පුවත්පත් නිවේදනය

නිකුත් කළේ **ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව**

දිනය **2013 නොවැම්බර් මස 14 වැනි දින**

2013 සැප්තැම්බර් මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

සමස්ත නිරීක්ෂණය

ශ්‍රී ලංකාවේ විදේශීය අංශය 2013 වසරේ සැප්තැම්බර් මාසයේ දී සතුටුදායක වර්ධනයක් පවත්වාගෙන යනු ලැබිණි. අපනයන ශක්තිමත් ලෙස වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස 2013 වසරේ පළමු මාස නවය තුළ දී වෙළෙඳ හිඟය තවදුරටත් අඩු විය. වෙළෙඳ හිඟය අඩු වීම, සේවා ගිණුම වෙත වූ ලැබීම් සහ පෞද්ගලික සංක්‍රාම ඉහළ යාම මූලික වශයෙන් හේතු වෙමින් ජංගම ගිණුමේ හිඟය අඩු විය. මීට අමතරව, ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළ තුළ පැවති උච්චාවචනයන් හමුවේ වුවද මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් ශක්තිමත්ව පැවතීම තුළින් 2013 වසරේ පළමු කාර්තු තුන තුළ දී 2012 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ගෙවුම් තුලනයේ සැලකිය යුතු අතිරික්තයක් පෙන්නුම් කෙරිණි.

ගෙවුම් තුලනයේ වෙළෙඳ ගිණුම

2013 සැප්තැම්බර් මාසයේ දී අපනයන ආදායම සහ ආනයන වියදම යන දෙකම පසුගිය වසරේ සම කාලපරිච්ඡේදයට සාපේක්ෂව සැලකිය යුතු වර්ධනයන් වාර්තා කළේය. 2013 සැප්තැම්බර් මාසයේ දී අපනයන ආදායම පසුගිය වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 890 ක් දක්වා සියයට 11.1 කින් වර්ධනය වූ අතර ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,614 ක් දක්වා සියයට 22.8 කින් වර්ධනය විය. සමුච්චිත අගයන්

සැලකීමේ දී, 2013 පළමු මාස 9 තුළ අපනයන ආදායම 2012 අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 0.3 කින් ධනාත්මක ලෙස වර්ධනය වූ අතර, ආනයන වියදම අඛණ්ඩව සියයට 0.9 කින් අඩු විය. 2013 සැප්තැම්බර් මාසයේ දී ගෙවුම් තුලනයේ වෙළෙඳ ශේෂය පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 698 ක් දක්වා සියයට 41.1 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වුවද, 2013 පළමු මාස 9 තුළ සමස්ත වෙළෙඳ ශේෂය 2012 සම කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 6,869 යේ සිට එ.ජ. ඩොලර් මිලියන 6,721 දක්වා සියයට 2.1 කින් අඩු විය.





ප්‍රධාන අංශයන් සියල්ලෙහි ධනාත්මක වර්ධනයන් වාර්තා කරමින් අපනයන ආදායම 2013 සැප්තැම්බර් මාසයේ දී අඛණ්ඩව සීඝ්‍ර ලෙස වර්ධනය විය. මේ සඳහා ප්‍රධාන වශයෙන් කාර්මික අපනයන ආදායමේ සැලකිය යුතු ඉහළ යාම දායක විය. 2013 සැප්තැම්බර් මාසයේ දී කාර්මික අපනයන ආදායම පසුගිය වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 638 ක් දක්වා සියයට 12.4 කින් වර්ධනය විය. එ.ජ. ඩොලර් මිලියන 387 ක් දක්වා සියයට 27.7 කින් රෙදිපිළි හා ඇඟළුම් අපනයන ශක්තිමත් ලෙස වර්ධනය වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ප්‍රධාන අපනයන ගමනාන්තයන් වන යුරෝපා සංගමය සහ ඇමෙරිකා එක්සත් ජනපදය වෙත කළ ඇඟළුම් අපනයන, එම ආර්ථිකයන් යථා තත්ත්වයට පත්වීම පෙන්නුම් කරමින් 2013 සැප්තැම්බර් මාසයේ දී පිළිවෙළින් සියයට 30.7 ක සහ 32.2 ක විශිෂ්ට වර්ධනයන් වාර්තා කළේය. මේ අතර, රබර් නිෂ්පාදිත අපනයන ආදායම පසුගිය වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 73 ක් දක්වා සියයට 28 කින් වර්ධනය වූ අතර, පසුගිය වසරේ සැප්තැම්බර් මාසයේ දී පැවති අඩු අගයන් මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. යන්ත්‍රසූත්‍ර හා උපකරණ, ප්‍රවාහන උපකරණ, රසායනික නිෂ්පාදිත, සම් නිෂ්පාදන සහ මූල ලෝහ යනාදියෙහි අපනයන ආදායම් ද කාර්මික අපනයනවල වර්ධනයට දායක විය. කෙසේ වුවද, මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ අපනයන පසුගිය වසරට සාපේක්ෂව වසර පුරාම සෘණාත්මක වර්ධනයන් අඛණ්ඩව පෙන්නුම් කරමින්, 2013 සැප්තැම්බර් මාසයේ දී සියයට 23.4 කින් අඩු වූ අතර, ජාත්‍යන්තර මිල

ගණන් පහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2013 සැප්තැම්බර් මාසයේ දී කෘෂිකාර්මික අපනයන එ.ජ. ඩොලර් මිලියන 239 ක් දක්වා සියයට 6 කින් ඉහළ ගිය අතර මේ සඳහා ප්‍රධාන වශයෙන් කුළුබඩු සහ මුහුදු ආහාර අපනයන ආදායම වැඩිවීම හේතු විය. කුළු බඩු අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 41 ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර ඒ සඳහා ගම්මිරිස් සහ කරාබුනැටි අපනයන පරිමාවේ මෙන්ම මිලෙහි ද සිදු වූ ඉහළ යාම හේතු විය. එමෙන්ම, පෙර වසරේ අනුරූප මාසයෙහි මුහුදු ආහාර අපනයනයෙහි වූ අඩු වටිනාකම, 2013 සැප්තැම්බර් මස මුහුදු ආහාර අපනයන ආදායම සියයට 42.1 කින් වැඩි වීමට හේතු විය. කෙසේ වුවද, තේ අපනයන මිලෙහි සියයට 9.9 ක වර්ධනයක් පැවතිය ද, අපනයන පරිමාවේ සිදු වූ අඩුවීම හේතුවෙන් මුළු අපනයනයෙන් සියයට 15.1 ක් වූ තේ අපනයන ආදායම සියයට 0.6 කින් සුළු වශයෙන් අඩු විය. පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව පසුගිය මාස 25 පුරාවට නොකඩවා අඩු වෙමින් පැවති රබර් අපනයන ආදායම, 2013 සැප්තැම්බර් මාසයේ දී ද සියයට 38.9 කින් අඩු වූ අතර, ජාත්‍යන්තර මිල ගණන් අඩුවීම සහ අඩු අපනයන පරිමාව මේ සඳහා හේතු විය.

2013 සැප්තැම්බර් මාසයේ දී ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,614 ක් දක්වා සියයට 22.8 කින් වර්ධනය වූ අතර, ඒ සඳහා 2012 සැප්තැම්බර් මාසයේ දී ආනයන වියදම අසාමාන්‍ය ලෙස අඩුව පැවතීම හේතු විය. ප්‍රධාන ආනයන කාණ්ඩයන් තුනෙහිම වර්ධනයන් වාර්තා කරන ලදී. ඉන්ධන සඳහා වූ වියදමෙහි සැලකිය යුතු වර්ධනය හේතුවෙන් 2013 සැප්තැම්බර් මාසයේ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,045 ක් දක්වා සියයට 26.7 කින් වර්ධනය විය. 2013 සැප්තැම්බර් මාසයේ දී පසුගිය වසරේ සම කාලයට සාපේක්ෂව ඉන්ධන ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 517 ක් දක්වා සියයට 61.5 කින් වර්ධනය වූ අතර, 2012 සැප්තැම්බර් මාසයේ දී බොර තෙල් ආනයන නොපැවතීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ඉදිරියට පැමිණෙන මහ කන්නය සඳහා ප්‍රමාණවත් පොහොර තොග පවත්වා ගැනීම සඳහා පොහොර ආනයනය කිරීම හේතුවෙන් පොහොර ආනයන වියදම ද පසුගිය වසරට සාපේක්ෂව සියයට 51 කින් වැඩි විය. කෙසේ වුවද, දියමන්ති සහ වටිනා ගල් වර්ග, තිරිගු සහ ඉරිගු, රෙදිපිළි හා රෙදිපිළි උපාංග සහ කෘෂිකාර්මික යෙදවුම් යනාදියෙහි ආනයන වියදම් මෙම මාසයේ දී අඩු විය. 2013 සැප්තැම්බර් මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයනය ද එ.ජ. ඩොලර් මිලියන 335 ක් දක්වා සියයට 19.7 කින් වැඩි වූ අතර, යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනයේ වූ සීඝ්‍ර ඉහළ යාම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ඉහළ යාම හේතුවෙන් 2013 සැප්තැම්බර් මාසයේ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සියයට 13.1 කින් වැඩි විය. පාරිභෝගික භාණ්ඩ යටතේ වර්ග කර ඇති රථවාහන ආනයන වියදම 2012 වසරේ ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන්ට ප්‍රතිචාර වශයෙන් 2012 අප්‍රේල් මාසයේ සිට අඩු වෙමින් පැවති නමුත්, 2013 ජූනි මාසයේ සිට එය නැවතත් වර්ධනයක් බවට පත් විය. පාරිභෝගික භාණ්ඩ

ආනයන වියදම සඳහා ඉහළම දායකත්වය ලබා දෙමින් 2013 සැප්තැම්බර් මාසයේ දී රථවාහන ආනයන වියදම සියයට 99.6 කින් වර්ධනය විය. මුහුදු ආහාර, තෙල් හා මේද, බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත සහ රෙදිපිළි හා උපාංග, පාරිභෝගික භාණ්ඩ ආනයන වර්ධනය සඳහා දායක වූ අනෙකුත් පාරිභෝගික භාණ්ඩයන් වේ. කෙසේ වුවද, කිරි නිෂ්පාදිත, එළවළු සහ පාන වර්ග සඳහා වූ ආනයන වියදම 2013 සැප්තැම්බර් මාසයේ දී අඩු විය.

ගෙවුම් තුලනයේ සේවා ගිණුම යටතේ වන සංචාරක ඉපැයීම්

2013 වසරේ පළමු මාස නවය තුළ දී සංචාරක ඉපැයීම් 2012 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 711.1 ක සමඟ සැසඳීමේ දී එ.ජ.ඩොලර් මිලියන 883.1 ක් දක්වා සියයට 24.2 ක වර්ධනයක් වාර්තා කළේය. 2013 වසරේ සැප්තැම්බර් මාසයේ දී සංචාරක පැමිණීම් පසුගිය වසරේ සැප්තැම්බර් මාසය සමඟ සැසඳීමේ දී 89,761 ක් දක්වා සියයට 26.2 කින් වර්ධනය විය. ඒ අනුව, වසරේ මුල් මාස නවය තුළ දී මුළු සංචාරක පැමිණීම් පසුගිය වසරේ අදාළ කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී 801,210 ක් දක්වා සියයට 15.5 කින් වර්ධනය විය. 2013 වසරේ සැප්තැම්බර් මාසය තුළ සංචාරකයන් පැමිණීමේ ප්‍රධාන මූලාශ්‍ර පහ ලෙස ඉන්දියාව, එක්සත් රාජධානිය, ජර්මනිය, මැදපෙරදිග හා මාලදිවයින හඳුනා ගැනුණු අතර, එය සැප්තැම්බර් මාසයේ මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 49.6 ක් විය.

ගෙවුම් තුලනයේ ජංගම සංක්‍රාම

ජංගම සංක්‍රාම සඳහා ප්‍රධාන දායකත්වයක් සපයන විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ 2013 වසරේ පළමු මාස නවය තුළ දී 2012 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එ.ජ.ඩොලර් මිලියන 4,922.3 ක් දක්වා සියයට 11.4 කින් වර්ධනය විය. වෘත්තීය හා පුහුණු අංශයන්ට අයත් ශ්‍රම සංක්‍රමණ ඉහළ යාම, සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වර්ධනය වීමට අඛණ්ඩව දායක විය.

ගෙවුම් තුලනයේ ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුම

ආයෝජකයින්ගේ ධනාත්මක විශ්වාසය ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙත වූ විදේශීය ලැබීම් හි වර්ධනය තවදුරටත් පවත්වාගෙන යාමට උපකාරී විය. 2013 වසරේ සැප්තැම්බර් මාසයේ දී කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත ශුද්ධ විදේශීය ලැබීම් ලෙස වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 10.6 සමඟ සැසඳීමේ දී 2013 ඔක්තෝබර් මාසයේ දී එය එ.ජ. ඩොලර් මිලියන 24.1 ක් විය. 2013 වසරේ පළමු මාස දහය තුළ දී කොටස් වෙළෙඳපොළ වෙත ලද සමුච්චිත ශුද්ධ විදේශීය ලැබීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 180.4 ක් විය. 2013 වසරේ පළමු මාස දහය තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ වෙත ලද ශුද්ධ ලැබීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 486.7 ක් විය. 2012 වසරේ පළමු මාස නවය තුළ

දී රජය විසින් ලබා ගත් දිගු කාලීන ණය ප්‍රමාණය වූ එ.ජ.ඩොලර් මිලියන 2,450.1 සමඟ සැසඳීමේ දී 2013 වසරේ සැප්තැම්බර් මස අග වනවිට රජය ලබාගත් දිගුකාලීන ණය ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 1,301.6 ක් විය. තවද, 2013 වසරේ පළමු මාස නවය තුළ දී වාණිජ බැංකු වෙත වූ විදේශීය ලැබීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 1,424.3 ක් විය. එසේම, ඩී.එෆ්.සී.සී බැංකුව විසින් 2013 වසරේ ඔක්තෝබර් මාසයේ දී විදේශිකයින්ට දිගුකාලීන බැඳුම්කර නිකුත් කිරීමෙන්, එ.ජ. ඩොලර් මිලියන 100 ක් රැස්කර ගන්නා ලදී.

ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය

2013 වසරේ පළමු කාර්තු තුන තුළ දී සමස්ත ගෙවුම් තුලනය එ.ජ. ඩොලර් මිලියන 585 ක අතිරික්තයක් වාර්තා කර ඇතැයි ඇස්තමේන්තු කර තිබේ. අභියෝගාත්මක ගෝලීය ආර්ථික තත්ත්වයන් හමුවේ වුවද ලද මෙම අතිරික්තය 2012 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ ලද එ.ජ. ඩොලර් මිලියන 269 ක අතිරික්තයට සාපේක්ෂව සැලකිය යුතු වර්ධනයකි.

ජාත්‍යන්තර සංචිත

2013 වසරේ සැප්තැම්බර් මස අග දී ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 7.0 ක් වූ අතර, වාණිජ බැංකුවල විදේශ වත්කම් ඇතුළත් මුළු විදේශීය සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 8.3 ක් විය. ආනයනික මාස වශයෙන් සැලකූ විට, දළ නිල සංචිත ප්‍රමාණය 2013 වසරේ සැප්තැම්බර් මස අග වනවිට ආනයනික මාස 4.4 කට සමාන වූ අතර, මුළු විදේශීය සංචිත ප්‍රමාණය ආනයනික මාස 5.3 කට සමාන විය. එ.ජ. ඩොලර් මිලියන 1,161 ක විදේශීය ණය සේවාකරණ ගෙවීම් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සමීපස්ථ ණය පහසුකම සඳහා වූ එ.ජ. ඩොලර් මිලියන 361 ක ණය ආපසු ගෙවීම් හමුවේ වුවද, සංචිත ප්‍රමාණවත් මට්ටමක පවත්වාගෙන යාමට හැකි වීම සැලකිය යුතු වේ.

විනිමය අනුපාතිකයේ හැසිරීම

2013 වසරේ මේ දක්වා කාලය තුළ දී අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම මත පදනම්ව ශ්‍රී ලංකා රුපියල ප්‍රධාන මුදල් වර්ග කිහිපයකට එරෙහිව ශක්තිමත්ව පැවතුණි. ඒ අනුව, 2013 නොවැම්බර් මස 13 දින වනවිට රුපියල, ජපන් යෙන්වලට එරෙහිව සියයට 12.4 කින් ද, ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 13.1 කින් සහ ඕස්ට්‍රේලියානු ඩොලරයට එරෙහිව සියයට 8.4 කින් ද අධිප්‍රමාණය විය. කෙසේ නමුත්, ජූනි මස මැද සිට අගෝස්තු මස අග දක්වා එ.ජ. ඩොලරයට එරෙහිව අවප්‍රමාණය වූ රුපියල, සැප්තැම්බර් මාසයේ දී ජාතික ඉතිරි කිරීමේ බැංකුව සිදු කළ බැඳුම්කර නිකුතුව ද ඇතුළුව බැංකු ක්ෂේත්‍රය තුළ ඉහළ ගිය ලැබීම් මූලික වශයෙන් උපකාරී වෙමින් එතැන්

සිට එ.ජ. ඩොලරයට එරෙහිව සියයට 1.4 කින් අධිප්‍රමාණය විය. සමස්තයක් ලෙස 2013 වසරේ නොවැම්බර් මස 13 දක්වා කාලය තුළ රුපියල එ.ජ. ඩොලරයට එරෙහිව සියයට 3.0 කින් ද, යුරෝවලට එරෙහිව සියයට 4.6 කින් හා ස්ටර්ලින් පවුමට එරෙහිව සියයට 1.4 කින් සුළු වශයෙන් අවප්‍රමාණය විය.

සංඛ්‍යා සටහන 1. විදේශ අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශයක් - සැප්තැම්බර් 2013 (අ)

	2012 සැප්. (එ.ජ.ඩො. මිලියන)	2013 සැප්. (එ.ජ.ඩො. මිලියන)	සැප්. වර්ධනය (සියයට)	2012 ජන. සිට සැප්. (එ.ජ.ඩො. මිලියන)	2013 ජන. සිට සැප්. (එ.ජ.ඩො. මිලියන)	ජන. සිට සැප්. වර්ධනය (සියයට)
අපනයන	**801.5**	**890.3**	**11.1**	**7,304.6**	**7,327.2**	**0.3**
මෙයින්:						
කෘෂිකාර්මික	225.5	238.9	6.0	1,736.3	1,837.2	5.8
මෙයින්: තේ	141.1	140.3	-0.6	1,031.6	1,102.9	6.9
කාර්මික	567.1	637.5	12.4	5,518.8	5,452.9	-1.2
මෙයින්: රෙදිපිළි හා ඇඟළුම්	303.0	386.9	27.7	2,972.3	3,126.6	5.2
රබර් නිෂ්පාදිත	57.2	73.3	28.0	644.3	616.0	-4.4
ආහාර පාන හා දුම්කොළ	35.1	18.8	-46.2	213.1	166.9	-21.7
ඛනිජ ද්‍රව්‍ය	8.1	12.7	55.7	42.2	28.1	-33.5
ආනයන	**1,314.4**	**1,613.9**	**22.8**	**14,173.1**	**14,048.5**	**-0.9**
මෙයින්:						
පාරිභෝගික භාණ්ඩ	206.1	233.0	13.1	2,291.7	2,332.9	1.8
මෙයින්: ආහාර හා පාන වර්ග	91.3	84.6	-7.4	993.9	1,026.3	3.3
ආහාරමය නොවන-පාරිභෝගික භාණ්ඩ	114.8	148.5	29.3	1,297.7	1,306.5	0.7
අන්තර් භාණ්ඩ	824.6	1,044.8	26.7	8,552.2	8,528.6	-0.3
මෙයින්: ඛනිජ තෙල්	319.9	516.7	61.5	3,715.3	3,829.3	3.1
රෙදිපිළි හා රෙදිපිළි උපාංග	179.5	174.0	-3.1	1,644.6	1,502.7	-8.6
ආයෝජන භාණ්ඩ	280.0	335.3	19.7	3,305.3	3,177.0	-3.9
මෙයින්: යන්ත්‍රසූත්‍ර හා උපකරණ	143.3	197.1	37.6	1,600.3	1,695.7	6.0
ප්‍රවාහන උපකරණ	52.0	35.9	-30.9	818.3	466.5	-43.0
ගොඩනැගිලි ද්‍රව්‍ය	84.4	101.8	20.6	883.3	1,010.6	14.4
වෙළෙඳ ශේෂය	**-512.9**	**-723.7**	**41.1**	**-6,868.5**	**-6,721.3**	**-2.1**
විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ	**511.2**	**588.7**	**15.2**	**4,418.7**	**4,922.3**	**11.4**
විදේශීය සෘජු ආයෝජන (ආ)				**451.7**	**540.2**	**19.7**
කොටස් වෙළෙඳපොළ විවිධ ආයෝජන (ශුද්ධ)	**23.3**	**10.6**		**249.8**	**156.3**	
සංචාරක ඉපැයීම්	**68.8**	**98.7**	**43.4**	**711.1**	**883.1**	**24.2**
වාණිජ බැංකු වෙත ලැබීම් (ඇ)					**664.3**	
රාජ්‍ය අංශයේ ලැබීම් (ඈ)	**213.5**	**185.5**	**-13.1**	**4,512.1**	**3,610.7**	**-20.0**
එයින්: භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර	87.1	29.6	-66.0	1,954.5	2,287.3	17.0
දිගුකාලීන ණය	119.4	155.8	30.5	2,450.1	1,301.6	-46.9

(අ) තාවකාලික

(ආ) අදාළ වර්ෂයේ පළමු භාගය සඳහා

(ඇ) 2012 වසර තුළ දී වාණිජ බැංකු විසින් ලබාගත් දිගුකාලීන විදේශ ණය එ.ජ.ඩොලර් මිලියන 973 ක් විය.

(ඈ) රජය ලද ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර විකිණීමෙන් ලද ලැබීම් සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.